# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2142/66 – 2019 සැප්තැම්බර් 25 වැනි බදාදා – 2019.09.25**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2019 අංක 178 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/6/2018/එච්ඩබ්ලිව්/406.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: HDS/LND/14/F/11.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ අනුරූප සටහනේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2019 සැප්තැම්බර් මස 11 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි.**– ප්‍රාදේශීය ලේකම්, හම්බන්තොට.

2. **ඉඩමේ විස්තරය.**– දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාගම් පත්තුව සුළු කොට්ඨාසයේ, ආරබොක්ක ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක එච්/එච්එම්බී/ආර්ඩීජී/2019/31 හා 2019.02.15 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – ආරබොක්කකැලේ – ප්‍රමාණය: හෙක්. 0.0131 ක් පමණ**

උතුරට: පලවින්නගේ රංජිත් මුතුකුමාරණ හිමිකම් කියන ආරබොක්කකැලේ; නැගෙනහිරට: රජය විසින් හිමිකම් කියන ආරබොක්කකැලේ; දකුණට: කැබලි අක්ෂර 'බී'; බටහිරට: කැබලි අක්ෂර 'බී' සහ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය හිමිකම් කියන ආරබොක්කකැලේ සහ පලවින්නගේ රංජිත් මුතුකුමාරණ හිමිකම් කියන ආරබොක්කකැලේ.

10 - 367

1A – G31096 – 26 (2019/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*